"මාගෙ පුතුව මල් යහන සදන්නෙ" 2

සන්නස නොවැම්බර් කළාපයෙන් ඉතිරි කොටස

ධර්මසිරි ගමගේ කලාකරුවා සිය නිර්මාණ පුරාම පතුරුවා හැර ඇත්තේ මව්-පිය අගය මෙන්ම යහපත්, ආදරණීය දෙමාපිය යුවළකගෙන් සැදුණ පවුලක සොයුරු සොයුරියන් අතර පවා පවතින සුන්දර සහෝදර සම්බන්ධතා පිළිබඳ වටිනාකම්ය. අරිසෙන් අහුබුදු විද්වතාණන් එක් අවස්ථාවක පළ කළ අදහසක් නම්, ධර්මසිරි ගමගේ මහතා අතින් ලියවුණ,

"අද දීගෙක ගිය නුඹ මට බුලත් අතක් දීලා
යන්න පිටත් වූ මොහොතේ මගේ දෙපා වැඳලා
මෙතෙක් සිනාවෙන් සිටි මා කොහෙදෝ තනි වීලා
නෙතේ කඳුළු සිර කරගෙන සිටියෙමි ඉවසාලා
පුංචි නංගියේ මගේ පුංචි නංගියේ ------"

යන ගීය පවුල් සම්බන්ධතා, පිළිබිඹු කෙරෙන ගීතයක් බවයි. ගීත රචකයකු වේවා, අන් කවර නිර්මාණ කරුවකු වේවා, සිය අත්දැකීම් ද පාදක කරගනිමින් යහපත් සමාජයක ඉදිරි ගමන ද අපේක්ෂාවෙන් තම නිර්මාණ බිහි කරන බව පැහැදිලිය. සමාජයක් තුළ උද්ගත වන අයහපත් සිතුවිලි හා ක්‍රියාදාමයන් ඉස්මතු කොට දක්වමින් එවන් ස්වභාවයන් අළලා තම නිර්මාණ කරණයට යොමු නොවූ කලා කරුවකු ලෙස ද ධර්මසිරි ගමගේ මහතා අපගේ ප්‍රසාදයට ලක් වෙයි.

තම දරුවන්ට පමණක් නොව සමස්ත ළමා ලෝකයටම බෙහෙවින් ඇලුම් කළ මෙම නිර්මාණ කරුවා අතින් ලියවුණ ළමා ගී ද කිහිපයක් වෙයි. "හා පැටවුන් වගේ - මුව පැටවුන් වගේ ---" යන ළමා ගීය හුදෙක් දරුවන් අතර ජනප්‍රිය වූවා පමණක් නොව වැඩිහිටියන්ගේ ද ප්‍රසාදයට පාත්‍ර වූවකි. මෙවන් අගනා පුද්ගලයකු පිළිබඳව ළමා, යොවුන්, තරුණ මෙන්ම වැඩිහිටි පරපුරේ ද ආදරය හා ගෞරවය නොඅඩුව හිමි විය යුතු වන්නේය.

ධර්මසිරි ගමගේ නම් වූ මෙම යහපත් පුද්ගලයා පිළිබඳව කිවහැකි තවත් බොහෝ දේ ඇත. පුවත්පත් කලාවේදියකු ලෙස ඔහු පළ කළ කුසලතාව මෙන්ම එම ක්ෂෙත්‍රයෙහි ලා යොවුන් පරපුර හා තරුණ පෙළ උනන්දු කරවූ අයුරු ද අපට සිහිපත් වෙයි. එතුමා පිළිබඳව, එතුමාගේ සොයුරිය ලතා ගමගේ මහත්මිය ලියා පළ කළ,"මිනිසත් බව දුටු සොඳුරු මිනිසා - ධර්මසිරි ගමගේ" නම් ග්‍රන්ථයෙහි කතුවරිය සඳහන් කරන, "අයියා මුළු ජීවිත කාලය පුරාම සිදු කළේ ලස්සන, පියකරු, ප්‍රසන්න, සුගන්ධවත් මල් කැකුළු පුබුදු කිරීමය." යන්න එතුමාගේ ජීවන තොරතුරු දන්නා කවුරුන් වුව එකඟ වන කියමනකි.

කුඩා දරුවන් සෞන්දර්යාත්මක හැඟීම්වලින් තොර නොවූ දරු පිරිසක් කරන්නට එතුමා ගත් තැත සුළුපටු නොවේ. "අපි මාසෙකට වරක් විතර වගේ ඔය පුංචි දරුවන්ට සෞන්දර්ය රස විඳින්න අවස්ථාවක් හදල දෙමු." "මේ වගේ දරුවන්ගේ ඇස් පාදන එක මොන තරම් වටිනා පින්කමක් ද? ඒවායේ අගය රුපියල් කෝටිවලින් මනින්න බැහැ නේ. කැලේ පිපෙන මල් කැලේම පර වෙලා යන්න ඉඩ නොදී දසතම සුවඳවත් කරමින් පිපෙන්න පරිසරය සකස් කරල දෙන්න ඕනෑ." ගමගේ මහතා විටින් විට මෙබඳු ප්‍රකාශ කළා පමණක් නොව එම අදහස් ක්‍රියාවට නැංවීමට ද පසුබට නොවීය.

මෙතුමාගේ නිර්මාණ කරණයට අමතරව සෙස්සන් වෙත පෑ දයාව, ආදරය, කරුණාව සීමා රහිත වූ තරම්ය. ලෝකයේ තනි වී සිටින අහිංසක වැඩිහිටි පිරිස් වෙත ද මෙතුමාගේ දයාන්විත මෙහෙවර ඉටු විය. වැඩිහිටි නිවාසයකට ගොස් එහි නේවාසික මව්පියවරුන්ගේ දුක් සැප සොයා බලන විටකදී මෙතුමාගේ සිත් තුළ පහළ වූ කාරුණික සිතුවිලි තමන්ට කියා සිටි ආකාරය එතුමාගේ නැගණිය පාඨක අප වෙත ඉදිරිපත් කර ඇත්තේ මෙසේය.

"මෙවැනි අහිංසක වැඩිහිටි සිතක් ලස්සනට දැල්වෙන පහනක් සේ ඒකාලෝක වන්නේ මෙයට හොඳින් ඇහුම්කන් දුන්නොත් පමණි." මෙවැනි පහන් හැඟීම් පෙරටු කොටගෙන එතුමා වැඩිහිටියන්ට සත්කාර, උපකාර කළ අවස්ථාවලදී ඔවුන්ගේ මුවින් පිට වූ ඇතැම් අදහස් ද ධර්මසිරි ගමගේ නම් වූ පින්වත් පුද්ගලයා පිළිබඳව අපට වඩාත් හඳුනාගැනීමට ඉඩ ප්‍රස්තාව ලබා දෙයි. වැඩිහිටි නිවාසයකට ගොස් තම කාර්යය ඉටු කොට ආපසු පිට වී යන මොහොතේ එක් වැඩිහිටියකු කළ ප්‍රකාශයකි මේ,"මහත්තයා ඇවිත් අපේ අඳුරු වෙලා තිබුණ සිත්වලට ආලෝකයක් ලබල දුන්නා. හෙට උදේට පායන හිරු අපිට තවත් ලස්සන දවසක් උදා කරලා දේවි." මේ වියපත් මුහුණුවල සතුට, සොම්නස, ප්‍රීතිය සමග, ජීවිතයට ආලෝකවත් හෙට දවසක යහපත් ප්‍රීතියක් සටහන් වී තිබුණ බව නැගණිය ලතා ගමගේ මහත්මිය පවසයි.

ධර්මසිරි ගමගේ මහතා පුවත්පත් කලාවට අදාළව, පුවත්පත් කලාවේ විශේෂාංග රචනය සඳහා අත්වැලක් ලෙස ප්‍රකාශයට පත් කළ 'සංසාර දර්ශන' නම් කෘතියෙහි ඇතුළත් වන බොහෝ ලිපි, ඒවායේ අන්තර්ගත අනුවේදනීය සිදුවීම් පාඨකයා තුළ සැබවින්ම පහන් සංවේගය දනවන ලෙස නිරූපණය කර ඇත. 'පුතකු බේරාගන්න පියකු විඳින දුකක්' නම් මාතෘකාවෙන් ලියා ඇති සංවේගජනක කතා පුවත අරඹන්නට පෙර එතුමා ඉදිරිපත් කරන සටහන මගින් ද අපට එතුමා පිළිබඳවම බොහෝ දේ දැනගන්නට සලස්වයි.

"කිරි දරුවන් මුදලට විකිණීම පිළිබඳ සිද්ධි රැසක්ම පසුගිය කාලයේදී ජනමාධ්‍ය මගින් හෙළිදරව් කෙරිණ. සිංහල සංස්කෘතියේ මූලිකම පවුරු පදනම දෙදරා ගියාක් වැනි සංවේගශීලී හැඟීමක් ඒ මොහොතේ අප සිත් තුළ ඇති විය. එහෙත් දරු සෙනෙහස මත්තේම හැපෙන මවුපියෝ ලොව තවමත් විරල නොවෙති. එවැනි මාපියන් අතර ඉහළම තැනක් හිමි කරගන්නා තාත්තා කෙනකු පිළිබඳ මෙම කතාව, දරු සෙනෙහස ඇති පියකු තම සිඟිති දරු පැටියා බේරා ගැනීමට පිරූ වීර්ය පාරමිතාව අපට සිහිපත් කරවන්නකි -----". මෙවැනි පූර්විකාවකින් අරඹා උක්ත මාතෘකාව යටතේ මෙතුමා ලියා ඇති ලිපිය කාගේ වුව සිත් තුළ දුක, වේදනාව පහළ කරවමින් ඇසට කඳුලක් නංවන සේ රචනා වූවකි. ලේඛන කලාව විෂයයෙහි සැබෑ දස්කම් පෑ ධර්මසිරි ගමගේ

සම්මානිත මහාචාර්ය
කුසුමා කරුණාරත්න

මැතිතුමන් ශ්‍රී ලංකාවාසී ජනතාවගේ හදවත් තුළ නොමැකී පවතින නාමයක් වනු ඇත.

ධර්මසිරි ගමගේ ගීත රචකයකු ලෙස, පුවත්පත් කලාවේදියකු ලෙස යනාදී වශයෙන් බහුවිධ ආකාරයට හඳුනාගෙන සිටි පාඨකයාට එතුමා තුළ වූ මානවහිතවාදී යහපත් ගතිගුණ මතු කර පෙන්වීමට එතුමාගේ නැගණිය අතින් ලියවුණ ඉහත සඳහන් කළ කෘතිය බෙහෙවින් ප්‍රයෝජනවත් වන බව එහි පසුවදන ලියා ඇති ප්‍රවීණ ලේඛිකා අනුල ද සිල්වා මහත්මිය කියා සිටින්නේ මෙලෙසිනි. "ධර්මසිරි ගමගේ නම් පුවත්පත් කලාවේදියා, ගීත රචකයා ගැන ඔහු ඇසුරු කළ, ඔහු ගැන කියවූ බොහෝ දෙනා දනිති. එහෙත්, ධර්මසිරි ගමගේ නම්, මිනිසත්කම දුටු මානවහිතවාදියා ගැන දන්නා අය ඇත්තේ ටික දෙනෙකි. ------ මේ පොතෙන් හඳුන්වා දෙන්නේ ඔහු තුළ ජීවත් වූ මානවහිතවාදියාය. ------ මේ මතක සටහන් කියවූ මගේ සිත්සතන් ද නිවී පහන් වූ බව මට දැනිණි."

සිය සහෝදර කලාකරුවකු ගැන අනුල ද සිල්වා ලේඛිකාව පවසන මෙම අදහස්වලින් ද, ධර්මසිරි ගමගේ නම් වූ චරිතය එදත්, අදත්, මතුදාත් ලක්මවගේ සිත සනහන අගනා චරිතයක් බව කියවෙයි.

බාල පරපුරේ ජීවිත හැඩගස්වන්නට යෝග්‍ය වන කියමන් මෙන්ම තම පවුලේම ඇත්තන්ගේ ද ඉදිරි ගමනට ආදර්ශවත් වන කියමන් ද මෙතුමා විසින් පළ කෙරුණ අවස්ථා බොහෝය. "ප්‍රථමයෙන්ම ඔබ ඔබටම පහනක් වන්න. එවිට ඔබේ හද සැබෑ මිනිස් සිතක් ලෙස පිවිතුරු කරගත හැකි වෙයි. අනතුරුව ඔබ අන්‍යයන්ට පහනක් වන්න. එවිට ඔවුන්ගේ දුක් පීඩා හා වේදනාවන් දෙස උපේක්ෂාවෙන් හා දයාර්ද්‍ර හැඟීමෙන් පිවිතුරු වූ ඔබේ සිතින් බැලිය හැකි වෙයි. තෙවනුව ඔබට ද, අන්‍යයන්ට ද පහනක් වන්න. එවිට අප ජීවත් වන මේ කුඩා විශ්වයෙහි මනුසත් වගට එරෙහිව පැවති, පවතින්නා වූ යම් බඳු දුක් අන්ධකාරයක් නිවා ලනු සඳහා මිනිස් බවින් සපිරුණු ප්‍රදීපාලෝකයක් වීමට ඔබට හැකි

වෙයි." මෙවන් රුවන් වැකි නිරතුරුවම ප්‍රකාශ කළ ධර්මසිරි ගමගේ මහතාණන් මිනිස් දිවිය හොඳින් හඳුනාගත්තා වූ ද, එහි යහ අයහ දෙපසම අත්දුටුවා වූ ද, සිය ජීවිත කාලය තුළ සැමට සුබසෙත් සලසන්නට වෙර දැරුවා වූ ද උත්කෘෂ්ට ලංකා පුත්‍රයකු බව අපගේ අවංක අදහසයි.

ශීඝ්‍රයෙන් විපර්යාසයට ලක් වෙමින් පවතින වර්තමාන සමාජයේ විරල වශයෙන් වුව හමු වන මෙවැනි ආදර්ශවත් චරිතවලින් සිය ජීවිතවලට ආලෝකයක් ලබාගැනීමට බොහෝ දෙනාට හැකි වෙතොත් කොතරම් නම් යහපතක්ද?

VCE Chemistry 2014

Individual and Groups
Early completion of syllabus and
Exam preparation
Home Visited

Priyantha Liyanage
0407664546